## දීමනාපත්‍ර (ඔප්පු) ඉඩමක් උකසට/ ඇපයට තබා ණය මුදලක් ලබා ගැනීම.

❖ දීමනාපත්‍ර (ඔප්පු) ඉඩමක් උකසට/ ඇපයට තබා ණය මුදලක් ලබා ගත හැකි ආයතන
  - ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි බලපත්‍රලාභී වාණිජ බැංකු
  - ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි බලපත්‍රලාභී විශේෂිත වාණිජ බැංකු
  - ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි මූල්‍ය ආයතන/ සමාගම්
  - සමුපකාර සමිති ආඥා පනත යටතේ ලියාපදිංචි සමිති/ සමාගම්
  - රාජ්‍ය සේවා අන්‍යොන්‍යය අර්ථ සාධක සංගමය/ රජයේ නිලධාරීන්ගේ යහසාධක සංගය
  - ශ්‍රී ලංකා පොලිස් ඉතිරි කිරීමේ සංගමය/ සමෘද්ධි බැංකුව/ සර්වෝදය ඩිවලොප්මන්ට් ෆිනෑන්ස් සමාගම

❖ ප්‍රාදේශීය ලේකම්වරයාගේ අවසර ලබා ගැනීම සඳහා ඉදිරිපත් කල යුතු ලේඛන.
  - දීමනාපත්‍රකරුගේ ඉල්ලීම් ලිපිය
  - දීමනාපත්‍රය/ දීමනාපත්‍රය සහතික කල පිටපත
  - දීමනාපත්‍රයට අදාල මෑතකදී ලබා ගත් සියලුම පත් ඉරු (මුල් ප්‍රදානයේ සිට මේ දක්වා)
  - දීමනාපත්‍රය උකසට/ ඇපයට තබා ණය මුදලක් ලබා ගැනීමට යෝජිත ආයතනයේ ලිපිය (ආයතනයේ නම හා ලිපිනය පැහැදිලිව සඳහන් කල යුතුය.)
  - ග්‍රාම නිලධාරී නිර්දේශිත ලිපිය

❖ ණය ලබාගත් මූල්‍ය ආයතනය වෙත නියමිත පරිදි ණය වාරික ගෙවා දීමනාපත්‍රය නිදහස්කර නොගතහොත් ඔබේ දීමනාපත්‍ර ඉඩම එම මූල්‍ය ආයතනයට පවරා ගැනීමේ හැකියාව ඇත.

---

## දීමනාපත්‍ර (ඔප්පු) ඉඩම් වෙනත් අයෙකුට පැවරීම.

❖ දීමනාපත්‍ර (ඔප්පු) ඉඩමක් වෙනත් අයෙකුට නොතාරිස් ඔප්පුවක් මඟින් පැවරීම සඳහා දීමනාපත්‍ර ඉඩම පිහිටා ඇති ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්වරයාගේ විධිමත් අවසරය ලබාගත යුතුය.

### දීමනාපත්‍ර ඉඩමක් පැවරිය හැක්කේ කාටද?

❖ දීමනාපත්‍රකරුගේ ඉඩම් සංවර්ධන ආඥා පනතේ 3 වන උපලේඛනගත ඥාතියෙකුට

❖ ගොවි පන්තියේ හෝ ඊට අදාළ කටයුත්තක නිරත අඩු ආදායම්ලාභී ශ්‍රී ලාංකික පුරවැසියෙක් වන අයෙකුට

❖ ඉඩම් සංවර්ධන ආඥා පනතේ 3 වන උපලේඛනගත ඥාතියෙකු වශයෙන් හඳුන්වන්නේ උප්පැන්න සහතිකය මඟින් සනාථ කර ගතහැකි ලේ ඥාතියෙකු වේ.එවැනි අවස්ථාවක පැවරුම්කරු ලාභියාගේ ආදායම පිළිබඳ තොරතුරු පරීක්ෂා කර නොබැලේ.

❖ ගොවි පන්තියේ තැනැත්තකු යනුවෙන් හඳුන්වන්නේ යම් ඉඩමක් තමා විසින් වගා කිරීමට කැමැත්ත ඇත්තා වූ නැතහොත් තම පවුලේ යම් සාමාජිකයෙකු ලවා වගා කරවා ගැනීමට කැමැත්තක් ඇත්තාවූද වගා කිරීමට හැකියාව ඇත්තාවූද කෘෂිකර්මයට සම්බන්ධ වෙනත් ආර්ථික කටයුත්තක නියැලී සිටියා වුවත් තමාගේ හා තම පවුලේ ජීවනෝපාය සඳහා එම ඉඩම අවශ්‍ය වන්නා වූ පවුල් ඒකකයේ වාර්ෂික ආදායම රු. 144000/= නොවැඩි තැනැත්තෙකු අදහස් වේ.(ඉඩම් රෙගුලාසි - 1853/50 හා 2014.01.03 දිනැති ගැසට් පත්‍රය අනුව)

**අවසරය ලබා ගැනීමට ඉදිරිපත් කළ යුතු ලේඛන.**

- දීමනාපත්‍රකරුගේ ඉල්ලීම් ලිපිය
- දීමනාපත්‍රය/ දීමනාපත්‍රය සහතික කල පිටපත
- දීමනාපත්‍රයට අදාල මෑතකදී ලබා ගත් සියලුම පත් ඉරු (මුල් ප්‍රදානයේ සිට මේ දක්වා)
- දීමනාපත්‍රයට අදාල පිඹුරු පිටපත/ අනුබෙදුම් සිදු කර පැවරීමක් නම් එම සිතියම
- දීමනාපත්‍රකරු/ කලත්‍රයා/ පවුල් ඒකකයේ සියළුම සාමාජිකයන්ගේ එකඟතාවය හා ඔවුන් අනාථභාවයට පත් වෙන බවට කාර්යාලීය ප්‍රකාශ (ජාතික හැඳුනුම්පත හෝ පිළිගත් හැඳුනුම්පතක් රැගෙන පැමිණිය යුතුයි.)
- ලේ ඥාතියෙකුට පැවරීමක් නම් ඥාතීත්වය සනාථ කරන ලේඛන(උප්පැන්න සහතිකය/ විවාහ සහතිකය)
- ලේ ඥාතියෙකුට නොවන අයෙකුට පැවරීමක් නම් පැවරුම්ලාභියාගේ
    - උප්පැන්න සහතිකයේ සහතික කළ පිටපත
    - ජාතික හැඳුනුම්පතේ සහතික කළ පිටපත
    - මාසික/ වාර්ෂික ආදායම දැක්වෙන ආදායම් වාර්තාව
- දීමනාපත්‍රකරු හා පැවරුම්ලාභියා පිළිබඳ ග්‍රාම නිලධාරී වාර්තා
- දීමනාපත්‍රකරුට පවතින වෙනත් ඉඩමක ඔප්පුවේ සහතික කල පිටපත
    - දීමනාපත්‍ර ඉඩමකින් කොටසක් පැවරිය හැක්කේ දීමනා පත්‍රෙය් අතුරු බෙදීම් සඳහා අවසර ඇති අනු බෙදුම් සිදුකල හැකි දීමනාපත්‍ර ඉඩම් සඳහා පමණි.

---

## බලපත්‍ර/ දීමනාපත්‍ර (ඔප්පු) ඉඩම්වල අයිතිය නම් කල හැක්කේ කාටද?

- තම භාර්යාවට/ ස්වාමිපුරුෂයාට (කලත්‍රයාට)
- ලේ ඥාතියෙකුට (උප්පැන්න සහතිකයක් මඟින් ඥාතීත්වය තහවුරු කල හැකි)
- ඔබ කැමතිනම් බලපත්‍රයේ/ දීමනාපත්‍රයේ (ඔප්පුවේ සඳහන් කර ඇති) කොන්දේසි වලට යටත්ව (අනු බෙදුම් සීමාව) ඉහත පුද්ගලයින් කිහිපදෙනෙකු සඳහාද පසු අයිතිය නම් කිරීමේ හැකියාව ඇත.

### බලපත්‍රයක පසු අයිතිය නම් කරන්නේ කෙසේද?

- නම් කිරීමට යෝජිත අයගේ නම/ නම් ඇතුලත් කරන ලද ඉල්ලීමේ ලිපිය ප්‍රාදේශීය ලේකම් වෙත ඉදිරිපත් කිරීම
- බලපත්‍රය හා බලපත්‍රෙය් සහතික කල පිටපත
- යෝජිත අයගේ උප්පැන්නය/ උප්පැන්න/ විවාහ සහතික
- ඉඩම පිහිටි කොට්ඨාසයේ ග්‍රාම නිලධාරී නිර්දේශ වාර්තාව
- බලපත්‍රකරුගේ කාර්යාලයීය ප්‍රකාශය (ජාතික හැඳුනුම්පත හෝ පිළිගත් හැඳුනුම්පතක් සමඟ පැමිණිය යුතුය)
- නම්වල වෙනසක් ඇත්නම් දිවුරුම් ප්‍රකාශයක්

### දීමනාපත්‍රයක (ඔප්පුවල) පසු අයිතිය නම් කරන්නේ කෙසේද?

- නම් කිරීමට යෝජිත අයගේ නම/ නම් ඇතුලත් කරන ලද ඉල්ලීම් ලිපිය
- දීමනාපත්‍රය (ඔප්පුව) හා දීමනාපත්‍රෙය් සහතික කල පිටපත
- දීමනාපත්‍රයට අදාල මෑතකදී ලබාගත් සියවම පත් ඉරු (මුල් ප්‍රදානයේ සිට මේ දක්වා)
- ඉ. කො. 155 ආකෘතිපත්‍ර 3 ක් සම්පූර්ණ කර ඉදිරිපත් කිරීම
- දීමනාපත්‍රකරුගේ කාර්යාලයීය ප්‍රකාශය (ජාතික හැඳුනුම්පත හෝ පිළිගත් හැඳුනුම්පතක් සමඟ පැමිණිය යුතුය)
- නම්වල වෙනසක් ඇත්නම් දිවුරුම් ප්‍රකාශය

- රු.25/= වටිනාකමින් යුත් මුද්දර 01 (පළමුවරට නම් කිරීමකදී)
- නොතාරිස්වරයෙකු මගින් අන්තිම කැමති පත්‍රයක් ලියාපදිංචි කිරීම
- මගින් වුවද පසු අයිතිකරුවෙකු නම් කිරීමට හැකියාව පවතී.

**දීමනාපත්‍ර (ඔප්පු) ඉඩමක ජීවිත භුක්ති අයිතිය ලබාගැනීමට කල යුතු දේ.**

- දීමනාපත්‍ර ඉඩමක දීමනාපත්‍රකරු මියගිය විට පසු අයිතිකරුවෙකු නම් කර තිබුණත් නැතත් දීමනාපත්‍රකරු විවාහක නම් එම දීමනාපත්‍රකරුගේ බිරිඳ හෝ සැමියාට (කලත්‍රයා) එම ඉඩමේ ජීවිත භුක්තිය හිමිවේ.
- ජීවිත භුක්තිය ලබා ගැනීම සඳහා පහත ලේඛන සමග ඉඩම් හිමිකරු මියගොස් මාස 06 ක් ඉකුත්වීමට පෙර ඔබ ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්වරයා හමුවන්න.
  - ඉල්ලුම්කරුගේ ඉල්ලීමේ ලිපිය
  - දීමනාපත්‍රය දීමනාපත්‍රය සහතික කල පිටපත
  - දීමනා පත්‍රයට අදාල මෑතකදී ලබා ගත් සියලුම පත් ඉරු (මුල් ප්‍රදානයේ සිට මේ දක්වා)
  - දීමනාපත්‍රකරුගේ මරණ සහතිකය
  - දීමනාපත්‍රකරුගේ විවාහ සහතිකය හෝ දරුවෙකුගේ උප්පැන්න සහතිකය
  - ග්‍රාම නිලධාරී නිර්දේශය
  - ඉඩම් හිමිකරු වූ බිරිඳ/ සැමියා මියයෑමෙන් පසුව කලත්‍රයා යළි විවාහවුවහොත් එම ඉඩම සඳහා වූ ජීවිත භුක්තිය අහෝසි වේ.

**දීමනාපත්‍ර (ඔප්පු) ඉඩමක මුල් අයිතිය ලබා ගැනීමට කලයුතු දේ**

- දීමනාපත්‍රකරු ජීවත්ව සිටියදී එම දීමනාපත්‍ර ඉඩම සඳහා පසු අයිතිකරුවෙකු නම් කර ඉඩමට අදිල පත්ඉරුව මගින් ලියාපදිංචි කර තිබුනේනම් දීමනාපත්‍රරු හා කලත්‍රයා මියගොස් මාස 06ක් ඇතුලත එම ඉඩමෙහි මුල් අයිතිය ලබාගැනීමට කටයුතු කල යුතු වේ.
- එසේ නොමැතිවුවහොත් මියගිය දීමනාපත්‍රකරුගේ 3 වන උපලේඛනගත ඥාතීත්වය අනුව නිසි උරුමකරු වෙත එම දීමනාපත්‍ර ඉඩමේ අයිතිය සාරෝපනය වේ.අයිතිය ලබා ගැනීම සඳහා පහත ලේඛන ඉදිරිපත් කල යුතුය.
  - ඉල්ලුම්කරුගේ ඉල්ලීමේ ලිපිය
  - දීමනාපත්‍රය දීමනාපත්‍රය සහතික කල පිටපත
  - දීමනාපත්‍රයට අදාල මෑතකදී ලබා ගත් සියලුම පත් ඉරු (මුල් ප්‍රදානයේ සිට මේ දක්වා)
  - දීමනාපත්‍රකරුගේ හා කලත්‍රයාගේ මරණ සහතිකය (අවශ්‍ය වන පරිදි)
  - ඉල්ලුම්කරුගේ ඥාතීත්වය තහවුරු කරන ලේඛන(උප්පැන්න සහතිකය/ විවාහ සහතිකය)
  - ග්‍රාම නිලධාරී නිර්දේශය
  - මියගිය දීමනාපත්‍රකරු අවිවාහක අයෙකු නම් දීමනාපත්‍රකරු මියගොස්
  - මාස 06ක් ඇතුලත නම් කර ඇති පසු අයිතිකරු තම අයිතිය සඳහා
  - ඉදිරිපත් නොවේ නම් එම පසු අයිතිකරුගේ අයිතිය අහෝසි වේ.
  - මියගිය දීමනාපත්‍රකරු විවාහක අයෙකු නම්, කලත්‍රයාගේ මරණයෙන්
  - මාස 06ක් ඇතුලත නම් කර ඇති පසු අයිතිකරු තම අයිතිය සඳහා
  - ඉදිරිපත් නොවේ නම් එම පසු අයිතිකරුගේ අයිතිය අහෝසි වේ.

# බලපත්‍ර ඉඩමක ජීවිත භුක්ති අයිතිය ලබාගැනීමට කලයුතු දේ

- බලපතුකරු එම බලපත්‍ර ඉඩම සඳහා පසු අයිතිකරුවෙකු නම් කර තිබුනේනම් බලපත්‍රකරු හා කලත්‍රයා මියගොස් මාස 06 ක් ඇතුලත තම අයිතිය වෙනුවෙන් ඉදිරිපත් වී එම බලපත්‍ර ඉඩමේ මුල් අයිතිය ලබා ගැනීමට කටයුතු කල යුතු වේ.
- එසේ නොමැතිවුවහොත්එම බලපත්‍ර ඉඩමෙහි අයිතිය මියගිය දීමනාපත්‍රකරුගේ 3 වන උපලේඛනගත ඥාතීත්වය අනුව නිසි උරුමකරු වෙත සාරෝපනය වේ.අයිතිය ලබා ගැනීම සඳහා පහත ලේඛන ඉදිරිපත් කල යුතුය.
    - ඉල්ලුම්කරුගේ ඉල්ලීමේ ලිපිය
    - බලපත්‍රය හා බලපත්‍රයේ සහතික කල පිටපත
    - බලපත්‍රකරුගේ හා කලත්‍රයාගේ මරණ සහතිකය (අවශ්‍ය වන පරිදි)
    - ඉල්ලුම්කරුගේ ඥාතීත්වය තහවුරු කරන ලේඛන(උප්පැන්න සහතිකය/ විවාහ සහතිකය)
    - ග්‍රාම නිලධාරී නිර්දේශය

- මියගිය බලපත්‍රකරු අවිවාහක අයෙකු නම් බලපත්‍රකරු මියගොස් මාස 06ක් ඇතුලත නම් කර ඇති පසු අයිතිකරු තම අයිතිය සඳහා ඉදිරිපත් නොවේ නම් එම පසු අයිතිකරුගේ අයිතිය අහෝසි වේ.
- මියගිය බලපත්‍රකරු විවාහක අයෙකු නම්, කලත්‍රයාගේ මරණයෙන් මාස 06ක් ඇතුලත නම් කර ඇති පසු අයිතිකරු තම අයිතිය සඳහා ඉදිරිපත් නොවේ නම් එම පසු අයිතිකරුගේ අයිතිය අහෝසි වේ.

---

# රජයේ ඉඩම් කොටසක් ලබා ගැනීම සඳහා

**පුද්ගලයෙකුට රජයේ ඉඩමක් ලබා ගතහැකි අරමුණු**

- පදිංචියට
- වගාවට
- වාණිජ කටයුතු සඳහා

**රජයේ ඉඩම් කොටසක් ලබා ගැනීමට තිබිය යුතු සුදුසුකම්**

- ශ්‍රී ලාංකික පුරවැසියෙකු වීම.
- වයස අවු: 18 ට වැඩි පුද්ගලයෙකු වීම.
- දකුණු පළාතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ බල ප්‍රදේශ තුළ ස්ථිර පදිංචි අයෙකු වීම.
- පදිංචියට හෝ තමන් සතුව ඉඩමක් නොමැති වීම.
- තම දෙමාපියන්ගෙන් හෝ පවුල් ඥාතීන්ට උරුම වීමට ඉඩම් නොමැලි වීම.

**රජයෙන් ඉඩම් කොටසක් ලබා ගැනීමට කල යුතු දේ.**

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ 2008/4 චක්‍ර ලේඛනය අනුව අවශ්‍ය කටයුතු සම්පූර්ණ කිරීමෙන් පසුව ඔබට රජයේ බිම් කොටසක් ලබා ගැනීමේ හැකියාව පවතී.

ඒ සඳහා..........................................

- ග්‍රාම නිලධාරී නිර්දේශ සහතික ඉල්ලුම් පත්‍රය ප්‍රාදේශීය ලේකම් වෙත ඉදිරිපත් කිරීම. සුදුසුකම්ලාභී නාම ලේඛනයෙහි ලියාපදිංචි වීම.

(මූලික ඉඩම් පරීක්ෂණය)

- ඉඩම් කච්චේරි පරීක්ෂණ සඳහා ඉදිරිපත් වීම.
- විරෝධතා හා අභියාචනා විභාග කර අවසන් තේරීමේ ලැයිස්තුව අනුව නව ඉඩම් බෙදා දීම හෝ අනවසරයෙන් භුක්ති විඳින රජයේ ඉඩම් සඳහා බලපත්‍ර ලබා දීම කරනු ලබයි.

**බෙදාදෙනු ලබන බිම් ප්‍රමාණය**

- පදිංචියට නම් උපරිම පර්. 20 යි.
- වගාවට නම් පර්. 80 යි. (රූඩ් 02)

**ඉඩම් කච්චේරි පැවැත්වීම**

- රජයේ බිම් කොටසක් ලබා ගැනීමට මූලික සුදුසුකම් සහිත පුද්ගලයින් තම තොරතුරු ඇතුලත් ඉල්ලුම් පත්‍රයක් සකස් කර ප්‍රාදේශීය ලේකම් වෙත භාරදී ලියාපදිංචි වීම නීතිමය අවශ්‍යතාවකි.
- ප්‍රාදේශීය ලේකම් විසින් පවත්වනු ලබන සුදුසුකම් පරීක්ෂණයට හා ඉඩම් කච්චේරියට ඉදිරිපත් වීම ඔබේ වගකීමකි.
- ඉඩම් කච්චේරි මගින් තේරී ඇති පුද්ගලයින්ගේ නම් ඇතුලත් මූලික තේරීම් ලැයිස්තුව ප්‍රාදේශීය ලේකම් විසින් ප්‍රසිද්ධ කරනු ලබයි. තෝරා ගෙන ඇති පුද්ගලයින් සඳහා විරෝධතාවයක් හෝ තෝරා නොගත් අයගේ අභියාචනයක් ඇත්නම් දින 14 ඇතුලත පළාත් ඉඩම් කොමසාරිස් වෙත ඉදිරිපත් කල යුතුය.
- ඉන් අනතුරුව විරෝධතා/ අභියාචනා පරීක්ෂණ පවත්වා අවසන් තේරීමේ ලැයිස්තුව ප්‍රසිද්ධ කරනු ලබන අතර අවසන් තේරීමේ ලැයිස්තුවේ නම් සඳහන් පුද්ගලයින් වෙත බලපත්‍ර/ දීර්ඝ කාලීන බදුකර ලබා දීම සිදු කරයි.

---

## දීර්ඝකාලීන බදු මත ඉඩම් ලබා දීම.

රජයේ ඉඩම් අඥා පනත යටතේ එම කච්චේරි මගින් අනුමත වූ වාර්ෂික ආදායම රු. 280000 ට වැඩි අය සඳහා දීර්ඝ කාලීන බදු පදනම මත ඉඩම් ලබා දේ.

- ඉඩම් කච්චේරි මගින් අනුමත වු අවසන් නාම ලේඛනයේ පිටපත
- ඉඩම් සංවර්ධන තත්ව වාර්තාව
- 19 පරිශිෂ්ටයේ වාර්තාව

---

## වාර්ෂික අවසරපත්‍ර නිකුත් කිරීම.

- රජයට අයත් මාර්ග රක්ෂිත, ඇල රක්ෂිත වැනි රක්ෂිත ඉඩම් සඳහා එලදාය භුක්ති විඳිමට පමණක් වාර්ෂිකව නිකුත් කරනු ලබන බලපත්‍ර5යකි.
- ඉල්ලීමේ ලිපිය
- බදු ලේඛනයට නම් ඇතුලත් කිරීමේ පෝරමය

---

## බෞද්ධ විහාරස්ථාන සඳහා නිදහස් දීමනාපත්‍ර

- ඉල්ලීමේ ලිපිය
- බදු ලේඛනයට නම් ඇතුලත් කිරීමේ පෝරමය (ග්‍රාම නිළධාරී, ජනපද නිලධාරී, ප්‍රාදේශීය ලේකම්,පළාත් ඉඩම් කොමසාරිස් අනුමත කරන ලද)